# WEATHER FORECAST FOR 14th JANUARY 2019
## (Issued at 05.30 a.m. on 14th January 2019)

Showers or thundershowers will occur at times in Eastern, North-Central, Central and Uva provinces.
Several spells of light showers will occur in Northern province and Hambanthota district.
Showers or thundershowers will occur at several places elsewhere after 2.00 p.m.
Showers can be expected in some places in the Western province in the morning too.

Heavy falls above 100 mm can be expected at some places in Sabaragamuwa, Central and Uva provinces and in Galle, Matara, Batticaloa, Ampara, Polonnaruwa and Kaluthara districts.
Fairly strong gusty winds up to 40 kmph can be expected over North-western province and in Gampaha district.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

නැගෙනහිර, උතුරු-මැද, මධ්‍යම සහ ඌව පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර උතුරු පළාතේ සහ හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිහින් වැසි වාර කිහිපයක් ඇතිවේ.
සෙසු පළාත්වල තැනින් තැන සවස 2.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.
බස්නාහිර පළාතේ ඇතැම් ප්‍රදේශවල වලට උදය කාලයේදී ද වැසි ඇති විය හැක.
ඇතැම් ස්ථානවලට විශේෂයෙන් සබරගමුව, මධ්‍යම සහ ඌව පළාත්වලත් ගාල්ල, මාතර, මඩකලපුව, අම්පාර, පොලොන්නරුව සහ කළුතර දිස්ත්‍රික්කවලත් මි.මී. 100 ට වැඩි තද වැසි ඇති විය හැක.
වයඹ පළාතේත් ගම්පහ දිස්ත්‍රික්කයේත් විටින් විට හමන පැ.කි.මී. 40 දක්වා තරමක් තද සුළං ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

# WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 05.30 a.m. on 14th January 2019)

Showers or thundershowers will occur at times in the sea areas off the coast extending from Hambantota to Trincomalee via Batticaloa. Showers or thundershowers may occur at several places in the sea area off the coast extending from Colombo to Hambanthota via Galle in the evening or night. Heavy showers can be expected at some places in both of the above sea areas.
Winds will be North-easterly and wind speed will be 30-40 kmph in the sea areas around the island.

**The sea areas off the coast extending from Mannar to Balapitiya via Puttalam and Colombo, and the sea area off the coast extending from Matara to Batticaloa via Hambantota can be fairly rough at times as the wind speed can increase up to 50 kmph at times.**

**Temporarily strong gusty winds and rough seas can be expected during thundershowers.**

**Naval and fishing communities are requested to be vigilant in this regards.**

## ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය
## 2019 ජනවාරි මස 14 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

හම්බන්තොට සිට මඩකලපුව හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වන අතර කොළඹ සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සවස් කාලයේ හෝ රාත්‍රි කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක. ඉහත සඳහන් මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථාන වලට තද වැසි ද ඇතිවිය හැක.

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දිශාවෙන් හමන අතර සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

මන්නාරම සිට පුත්තලම සහ කොළඹ හරහා බලපිටිය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සහ මාතර සිට හම්බන්තොට හරහා මඩකලපුව දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 පමණ දක්වා වැඩි විය හැකි අතර එම මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව රළු විය හැක.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

Amilla

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/01/14
Time : 0544 hrs
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE